# <u>මාසික වැඩසටහන   2013 - දෙසැම්බර්</u>

සමාජයක පවතින ජනමාධ්‍ය සම්ප්‍රදාය යනු ඒ රටේ සමාජ-සංස්කෘතික ප්‍රගතිය පිළිබඳව දර්ශකයකි; කැඩපතකි; හරස්කඩකි.

අපේ රටේ පවතින ජනමාධ්‍ය සම්ප්‍රදාය, පසුගිය දශකය හා සසඳා බලනවිට තම අවගමනය, පරිහානිය මනාව පෙන්නුම් කොට ඇත. නමුත් මේ තත්වය තෙරුම්ගෙන ඇත්තේ, සමාජයේ ( ප්‍රමාණාත්මකව ගත්විට ) ඉතා සුළු පිරිසක් වන සංස්කෘතික සමාජ ස්ථරය පමණි .අද අපේ රටේ ප්‍රධාන ධාරාවේ (මුද්‍රිත/විද්‍යුත්) ජනමාධ්‍ය යනු, සමාජ ප්‍රගමනයට / ඉතිහාසයට වග නොකියන, වගකීම් විරහිත , ජාතිවාදී/ආගම්වාදී/මිත්‍යාලෝලී හා දේශපාලනික වශයෙන් නියාලු වූ එමෙන්ම හුදෙක් වානිජවාදී ව්‍යාපාරයක් තෙක් පල්ලම් බැස ඇති (ප්‍රචාරනවදී/මුද්‍රණ) කර්මාන්තයකි.

මේ තත්වය පිලිබඳ සංවාදාත්මක කතිකාව අපගේ මෙවර මාසික වැඩසටහනේ නිමිත්ත බවට පත්කර ගතිමු.

ඒ අනුව මෙවර අපගේ ආරාධිත දේශකයා වන්නේ මාධ්‍යවේදී තිලක් සේනාසිංහ මහතාය.

ස්ථානය : ආචාර්ය එන්. එම්. පෙරේරා මධ්‍යස්ථානය .

දිනය සහ වෙලාව :  2013 දෙසැම්බර්  23  වන සඳුදා  ප. ව. 4.15

දේශනය සැමට විවෘතයි !

තාරක වරාපිටිය

ලේකම්